# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2472/50 - 2026 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2026.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: BKP/LAND/ACQUI/D2/3/5-3.
*ඉඩම් අමාත්‍ය. අංකය*: 4-3/18/2021/WS/145.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමය යටතේ හල්ලොළුව බූස්ටර් පොම්පාගාරය ඉදි කිරීම සඳහා දවට ගහයට කුඹුර, කොස්ගහ යට කනටි සහ මැද කන්ද යන ඉඩම්වල එකතුව නමැති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්ඔලුව ග්‍රාම නිලධාරි වසමේ එරබදුවල ගම තුළ කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක 610467 දරන මූලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අංක 1 සහ 2 වේ.

වන්දි හිමිකම් පරීක්ෂණ දින:
අංක 610467 කැබලි අංක 01, 02 සඳහා 2026.03.09 වෙනි දින පෙ.ව. 10.00ට

කැබලි අංක 01, 02
ඉඩමේ නම: දවට ගහයට කුඹුර, කොස්ගහ යට කනටි සහ මැද කන්ද යන ඉඩම් වල එකතුව; හිමිකම්පාන්නන්ගේ නම් සහ ලිපින: 01. එච්. රංජිත් පාලිත ප්‍රේමතිලක, අංක බී/22/1, බෝගල පාර, එරබදුවල, කන්නත්තොට, 02. එච්. ධර්මප්‍රිය ගුණරත්න, අංක 14, බෝගල පාර, එරබදුවල, කන්නත්තොට; ප්‍රමාණය: හෙක්. 0.0194.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.03.09 වැනි දින පෙ.ව. 10.00 ට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.03.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එච්. ආර්. එම්. පී. අබේරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2026 ජනවාරි මස 20 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0238

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: WEG/LAN/L9/ACQ/72.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවන් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්/පරවශතාවන්ගේ විස්තර :-*

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මිරිස්ස දකුණ 1 ගමේ පිහිටි පිඹුරු අංක ක.සි. 820085 පිඹුරේ මතු සඳහන් ඉඩම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මිරිස්ස අඩවි ආරක්ෂක කාර්යාලය ඉදි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

**කැබලි අංක 01**
ඉඩමේ නම: දොඩම්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0184.

**කැබලි අංක 02**
ඉඩමේ නම: දොඹගහවත්ත සහ දොඹගහකොරටුව *නොහොත්* දොඩම්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, තාවකාලික ගොඩනැගිල්ලක්, ළිඳක්, වැසිකිලියක් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.1963.

**කැබලි අංක 03**
ඉඩමේ නම: දොඩම්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩු බිම; ප්‍රමාණය: හෙක්. 0.0007.

**කැබලි අංක 04**
ඉඩමේ නම: දොඩම්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩු බිම; ප්‍රමාණය: හෙක්. 0.0013.

**කැබලි අංක 05**
ඉඩමේ නම: දොඩම්ගහවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩු බිම; ප්‍රමාණය: හෙක්. 0.0031.

ඉහත සඳහන් ඉඩම්/පරවශතාවයන්ට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.03.30 වැනි දින පෙ.ව. 10.00 ට වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.03.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවයන් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ටී. එල්. එන්. එස්. මෙන්ඩිස්,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2026 ජනවාරි මස 20 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.